www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ විරුද්ධ පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනෙක් ආන්ඩුට පනිති

**Two Sri Lankan opposition MPs cross over to government**

**එම්. වසන්තන් සහ ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**

2010 අගෝස්තු 16

ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ විරුද්ධ පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනෙක් ඔහුගේ පාලක සන්ධානයට අගෝස්තු 05 දින එක්වීමත් සමග තුනෙන් දෙකේ පාර්ලිමේන්තු බහුතරය ලබා ගැනීමේ සහ ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට හැකියාව ලබා ගැනීමේ ඔහුගේ ඉලක්කය දෙසට පියවරක් තැබුවේ ය. සූදානම් කෙරෙමින් පවතින ව්‍යවස්ථා සංශෝධන තව දුරටත් රාජපක්ෂ බලයේ සිටීම තහවුරු කිරීමට සහ ඔහුගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලන විධි නීත්‍යානුකූල කිරීමට සකස් කෙරෙයි.

ආන්ඩුවට පැන්න දෙදෙනා "පී. දිගම්බරම් සහ ප්‍රභා ගනේෂන්" දෙමල කථාකරන වතු කම්කරුවන් අතර පක්ෂ සහ වෘත්තීය සමිති යන දෙආකාරයෙන්ම ක්‍රියා කරන සංවිධානවල සාමාජිකයෝය. දිගම්බරම් ජාතික කම්කරු කොන්ග්‍රසයේ (එන්යූඩබ්ලිව්) නායකයා ය. ගනේෂන් ඔහුගේ වැඩිමහල් සහෝදරයා වන මනෝ ගනේෂන් නායකත්වය දරන ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුනට (ඩීපීඑෆ්) අයත් ය. පසුගිය සතිය වන තුරු ඔහු වතුකරය පදනම් වූ වෘත්තීය සමිතියක් වන ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු කොන්ග්‍රසයේ (ඩීඩබ්ලිව්සී) මූල්‍ය ලේකම් ව සිටියේ ය.

කොලඹ ව්‍යාපාරිකයන් වන මොවුන් දෙදෙනා විරුද්ධ පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය (එජාප) විසින් නායකත්වය දෙන ලද එක්සත් ජාතික පෙරමුන (එජාපෙ) ධජය යටතේ අප්‍රේල් මහ මැතිවරනයේ දී තරග කලෝය. ඔවුන්ගේ අනෙක් පැත්ත ගැසීම සියලුම වතු කම්කරුවන් මත පදනම් වූ පක්ෂවල සහ වෘත්තීය සමිතිවල දූෂිත සහ දෙපිටකාට්ටු චරිතය පිලිබඳව තවත් නිදසුනක් විය.

වතු කම්කරුවන් අතර ආන්ඩුවට සහ එහි සහායකයා වන පසුගිය සැප්තැම්බරයේ දී තවත් අවුරුදු දෙකක් සඳහා දරිද්‍රතා මට්ටමේ වැටුප් පවත්වා ගෙන යාමේ වැටුප් මගඩියක් පැටවූ ලංකා කම්කරු කොංග්‍රසය (සීඩබ්ලිව්සී) - කෙරෙහි පලල්ව පැතිරී ගිය විරෝධය හේතුවෙන් එන්යූඩබ්ලිව් සහ ඩීඩබ්ලිව්සීයට අප්‍රේල්වල දී වතු කම්කරු ජනතා සහය ලබා ගත හැකි විය. එන්යූඩබ්ලිව් සහ ඩීඩබ්ලිව්සී ගිවිසුම පිලිගැනීමට පෙර එහි විරුද්ධවාදීන් ලෙස මවා පෑහ.

මැතිවරන ව්‍යාපාරයේ දී දිගම්බරම් සහ ගනේෂන් දෙදෙනාම වතු කම්කරුවන්ගේ ජීවන තත්වයන් වැඩි දියුනු කිරීමට නොහැකි වීම ගැන ආන්ඩුව විවේචනය කල අතර වතු කම්කරුවන් පාවා දීම සම්බන්ධයෙන් සීඩබ්ලිව්සීයට චෝදනා කලහ. දිගම්බරම් වතු කම්කරුවන් බහුලව වෙසෙන නුවරඑලිය දිස්ත්‍රික්කයේ දෙවන වැඩිම මනාපය ලබා ගත්තේ ය. ගනේෂන් කොලඹින් තේරී පත් විය.

ආන්ඩුවට පැනීම වතු කම්කරුවන් අතර කෝපය ඇවිලීමට හේතු වෙතියි ඒත්තු ගැනීම නිසා පක්ෂය පාවා දුන්නේ යැයි ප්‍රකාශ කරමින් ඩීපීඑෆ් සහ ඩීඩබ්ලිව්සී ප්‍රභා ගනේෂන්ගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටවූහ. ගනේෂන් ඩීපීඑෆ් හා රජය අතර රහස්‍ය ගනුදෙනු එලිකරන්නේ යැයි තර්ජනය කරමින් ප්‍රතිචාර දැක්වූයේය. නමුත් ඒ පිලිබඳව පැහැදිලි කිරීමක් නොකලේ ය. ගනේෂන් තමාගේ පුද්ගලික ගනුදෙනුව මගින් පක්ෂය පාවාදීමට ප්‍රථම ඩීපීඑෆ් සමස්තයක් වශයෙන් මේ වන විටත් රාජපක්ෂ ආන්ඩුව සමග සාකච්ඡාවල නිරත වූ බව කිසිසේත්ම පුදුමයට කරුනක් නොවේ.

දිගම්බරම් 2009 මැයි වල දී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව ආන්ඩුවේ තිරශ්චීන යුද්ධය අවසන් වීමෙන් පසුව රටේ දෙමල සුලුතරයට උදව් කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් "ජාත්‍යන්තර ප්‍රජාවට" දෝෂාරෝපනය කරමින් ඔහුව ම ආරක්ෂා කර ගැනීමේ යෙදුනි. ඔහු දස දහස් ගනන් දෙමල වැසියන් ඝාතනයට සහ එයටත් වඩා ගනනක් අනුකම්පා විරහිතව යුද සිරකරුවන් සේ

සිර කිරීමට වගකිවයුතු රාජපක්ෂගේ යුද්ධයට සහය දුන් එක්සත් ජනපදයේ සහ අනෙකුත් ප්‍රධාන බලවතුන්ගේ අසංවේදී නොසැලකීම තමා එම රජයට ම සම්බන්ධ වීම යුක්ති සහගත කිරීමට යොදාගත්තේ ය.

රජයට සම්බන්ධ වීම මගින් ඔවුන්ගේ ජනයාට උදව් කල හැකි බව දිගම්බරම් සහ ප්‍රභා ගනේෂන් විහිලු සහගත ලෙස ප්‍රකාශ කලෝ ය. සීඩබ්ලිව්සී සහ කඳුරට ජනතා පෙරමුන (යූපීඑෆ්) රාජපක්ෂ ආන්ඩුවට සහභාගිවීම ආරක්ෂා කිරීමට යොදාගත්තේ ද මේ ප්‍රයෝගයම ය. සීඩබ්ලිව්සී ජාතික සංවිධායක එන්. ජෙගදීස්වරන් "අප සැම කල්හිම කියා සිටියේ අපට අපේ ප්‍රජාවට සැලකිය හැකි වන්නේ රජයට එක්වීමෙන් පමනි" යැයි පැවසීමේ අවස්ථාව මග නොහලේ ය.

සත්‍ය වශයෙන්ම වතු කම්කරුවන් ශ්‍රී ලංකා කම්කරු පන්තියේ ඉතාමත්ම පීඩිත ස්ථරයන් අතර සිටී. උද්ධමනයට නොගැලපෙන වැටුප් ගිවිසුම් පැටවීම මගින් මේ තත්වය තවත් උග්‍ර කලේය. වතු කම්කරුන් සඳහා සත්‍ය වැටුප් දර්ශකය 10% කින් එනම් (2004) 92 සිට (2009) 83 දක්වා පහල ගියේ ය. කම්කරුවන් තවමත් ජීවත් වන්නේ නියම අධ්‍යාපනික සෞඛ්‍ය සහ සනීපාරක්ෂක පහසුකම් නොමැති ලයින් කාමරවල ය.

ඩීපීඑෆ් සෙසු වතුකර පක්ෂවලට එරෙහිව ප්‍රගතිශීලී විකල්පයක් ලෙස පැරනි රැඩිකලුන් වන - නව සමසමාජ පක්ෂය (නසසප) සහ එක්සත් සමාජවාදී පක්ෂය (එසප) - විසින් හුවා දැක්වීමේ භූමිකාව සැලකිල්ලට ලක් විය යුතුය. නසසප සහ එසප රාජපක්ෂගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද ඇතුලුව - ලොකු සහ කුඩා - ධනපති පක්ෂ සමග දිගු සහ ජුගුප්සාජනක අවස්ථාවාදී සංධාන ගැසීමේ ඉතිහාසයක් ඇත. 2006 සිට නසසප සහ එසපය රාජපක්ෂ ආන්ඩුවේ යුද්ධයට සහ ඔහුගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී විධි වලට විරුද්ධව විවිධාකාර පෙරමුනු සංවිධානවලදී ඩීපීඑෆ් සමග සම්බන්ධ විය. දැන් එන්යූඩබ්ලිව්හි එකම පාර්ලිමේන්තු නියෝජිතයා එම රජයට ම සම්බන්ධ වී ඇත.

අප්‍රේල් මැතිවරන ව්‍යාපාරයේ දී එන්යූඩබ්ලිව් නායක දිගම්බරම් රාජපක්ෂ ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට අවශ්‍ය තරම් ආසන ප්‍රමානය ලබා ගැනීම වැලැක්වීමට මහජනයා උනන්දු කරමින් අනෙකුත් විරුද්ධ පක්ෂ අනු ගියේ ය. "පාලක පක්ෂය තුනෙන් දෙකේ බහුතරයක් මැතිවරනයේ දී ලබා ගත හොත් ඇතිවන දේශපාලන ප්‍රතිවිපාකයන් සැලකිල්ලට ගනිමින් ඡන්දය පාවිච්චි කරන්නේ කාටද යන්න තීරනය කල යුතුයැයි" සුලුතර (දෙමල) ජනයාට අනතුරු ඇඟවූවේය.

ප්‍රධාන වශයෙන්ම විරුද්ධ පක්ෂය වන එජාප සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) මූලිකව එකම ප්‍රතිපත්තිය අනුගමනය කිරීම හේතුවෙන් පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) 225 ක් වන පාර්ලිමේන්තු මන්ත්‍රී ආසන සංඛ්‍යාවෙන් 143ක් දිනා ගත්තේ ය. එහෙත් මෙය තව දුරටත් තුනෙන් දෙකේ බහුතරය ලබා ගැනීමට එජනිස හට ආසන 7ක ඌනතාවක් ඇති කලේ ය. දැන් දිගම්බරම් සහ ගනේෂන් රාජපක්ෂට ඔහුගේ අභිප්‍රාය ඉටු කර ගැනීම කරා වඩාත් සමීප වීම සඳහා ආසන දෙකක් ලබා දී ඇත.

රාජපක්ෂ එජාප පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට රජයට පැනීමට ධෛර්ය දීම සඳහා පස්සා දොර හොර ගනුදෙනුවල යෙදී සිටී. දැනටමත් එක් අයෙක් ආන්ඩුව සමග ඡන්දය භාවිතා කරන අතර තව දෙදෙනෙක් එය අනුයතියි සැලකේ. කොලඹ දේශපාලන සංස්ථාපිතයේ දූෂිත සහ නිහීන ස්වභාවය සැලකූකල තවත් දෙදෙනෙකු විවිධාකාර අල්ලස් සහ රජයේ වරප්‍රසාද හරහා පොලඹවා ගැනීම පිලිබඳව කවර හෝ සැකයක් තබා ගත යුතු නැත.

මේ වන විටත් ඇමති මන්ඩලය සහ සමස්ත ආන්ඩුවම පහ කිරීම ඇතුලු අතිවිශාල බලතල ප්‍රමානයක් පවතින ව්‍යවස්ථාව තුල විධායක ජනාධිපතිට තිබේ. ඇමතිවරු, ජෙනරල්වරු සහ ජ්‍යෝෂ්ට රාජ්‍ය නිලධාරින් සහිත කුඩා කන්ඩායමක් මගින් පාර්ලිමේන්තුව සාර්ථකව නොසලකා හරිමින් හැකි උපරිම ආකාරයෙන් පවතින ව්‍යවස්ථාව රාජපක්ෂ ඔහුගේ ප්‍රයෝජනයට යොදා ගෙන ඇත. ප්‍රධාන අමාත්‍යංශ වන ආරක්ෂක, මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යංශ රාජපක්ෂ අතේම තබා ගෙන ඇත. සිවිල් යුද්ධය අවසාන වුව ද රජය විසින් අඛන්ඩව පවත්වාගෙන යන හදිසි නීතිය යටතේ අතිශය මර්දනීය බලතල ඔහුට තිබේ.

ව්‍යවස්ථාවට කෙරෙන සැලකිය යුතු වෙනස්කම් සම්බන්ධව රාජපක්ෂ පෙරඇඟවුම් කර ඇත. ඔහු විපක්ෂය නම් කරන අයගෙන් ද සමන්විත ප්‍රධාන රාජ්‍ය නිලධාරින් පත් කිරීම සහ මැතිවරන, පොලිස්, සහ රාජ්‍ය අල්ලස් දූෂන කොමිසම පිහිටුවීම අධීක්ෂනය කරන ව්‍යවස්ථාදායක සභාව ස්ථාපිත කිරීමට අවශ්‍ය වන 17 වන ව්‍යවස්ථා සංශෝධනය නවීකරනය කිරීමට සැලසුම් කරමින් සිටී.

රාජපක්ෂ 17 වන ව්‍යවස්ථා සංශෝධනය සරලව නොතකා හැරි අතර ඔහුගේ හිතවාදීන් සහ හෙන්චයියන් බල අධිකාරියේ තනතුරුවලට පත් කිරීම වලකන ව්‍යවස්ථාදායක සභාව පත් කිරීම ප්‍රතික්ෂේප

කර ඇත. ඔහු ව්‍යවස්ථාවෙන් බැඳී සිටින උපරිමාධිකරන නියෝග පවා නොතකා හැර කටයුතු කර තිබේ. දැන් ඔහු ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට සැලසුම් සකස් කරමින් සිටී.

රජය ජනාධිපති ධූරය සඳහා වන වාර දෙකක සීමාව ඉවත් කිරීම අරමුන කර ගෙන ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට ද සැලසුම් කරමින් සිටී. ජනාධිපති ධූර කාලය අවුරුදු 6 කි. 2005 නොවැම්බර් ජනාධිපතිකම දිනූ රාජපක්ෂ අවුරුදු 2කට කලින් ජනවාරි මාසයේ දී ජනාධිපතිවරනයක් කැඳවීය. කෙසේ හෝ ඔහු ඔහුගේ ප්‍රථම ධූර කාලයෙන් දෙවන ධූර කාලයට අවුරුද්දක් එක් කර ගැනීමට අධිකරන නියෝගයක් ලබා ගත්තේ ය. ව්‍යවස්ථා සංශෝධනය කර ගැනීමේ හැකියාව ඔහුට ලැබුනොත් ඔහු මීටක් වැඩි කාලයක් සමහර විට අසීමිත කාලයක් ධූරයේ රැඳෙනු ඇත. දේශීයව සහ ජාත්‍යන්තරව සැලකිය යුතු විරෝධතාවයක් අවුලුවමින් ආන්ඩුව ජුලි මාසයේ යෝජිත ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කලේය.

රාජපක්ෂ ව්‍යවස්ථා සංශෝධන කල් දමමින් සහ සැලසුම් කර ඇති සංශෝධන පිලිබඳ එජපෙ සමග සාකච්ඡාවලට එලඹෙමින් ව්‍යවස්ථාවට එරෙහි විවේචනයන් අපසරනය කලේය. ජනාධිපති විශේෂයෙන්ම එජපයෙන් මන්ත්‍රීවරුන් ආන්ඩුවට පැනීමට පෙලඹවීම කෙරේ උත්සාහයන් දැඩි කරමින් සිටින අතර එජාප සමග සාකච්ඡා කිරීම කල්මැරීමේ උපායක් විය.

රාජපක්ෂ විශාල පන්ති අරගලවලට සූදානමින් ඔහුගේ රාජ්‍යතන්ත්‍රය ස්ථාවර කරගැනීමට උත්සාහ දරමින් සිටී. රාජපක්ෂගේ අධික යුද වියදම් හේතුවෙන් රට නය වගුරෙහි ගිලී ඇත. එමෙන්ම ඔහුගේ අවුරුදු 4ක ධූර කාලයේ දී රාජ්‍ය නය 160% කින් වර්ධනය විය. ඇයවැය හිඟය දල ජාතික නිෂ්පාදනයෙන් 10% දක්වා ලඟාවිය. ආන්ඩුව දැන් රාජ්‍ය වියදම් කපා දැමීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පීඩනයට ලක්වෙමින් සිටී. ජූනි මස අයවැයෙන් රාජ්‍ය අංශයේ වැටුප් වැඩිවීම් අත්හිටුවීමකින් සහ ප්‍රධාන භාන්ඩ සඳහා ඉහල බදු පැනවීමෙන් කප්පාදුව ආරම්භ කර ඇත.

තව දුරටත් ඔවුන්ගේ ජීවන තත්වයන් කාබාසිනියා වීමට එරෙහිව මතුවන වැඩ කරන ජනතාවගේ කවර හෝ විරුද්ධත්වයකට පහර දීම සඳහා 25 වසරක සිවිල් යුද්ධය තුල ගොඩ නන්වන ලද පොලිස් රාජ්‍ය තන්ත්‍රය සහ එහි විධික්‍රම යොදා ගැනීමට ආන්ඩුව සූදානම් වෙමින් සිටී.

© www.wsws.org